# සඳා ඔබෙයි මා

## හේමාල් ජයවික්‍රම ගීත සමුච්චය




සංගීතඥයින් කිහිප දෙනෙකුගේ ම නිජබිම වූ කඩුගන්නාව තම ගම් පියස වුව ද, නුගවෙල මධ්‍යම විද්‍යාලයේ දී හින්දි ගී ගයමින් "ලෝකල් රාෆි" ලෙස මිතුරන් අතරේ නමක් දිනා ගත්ත ද, හේමාල් ජයවික්‍රමගේ සිත මුලින් ම ඇදී ගියේ ගණිතයටයි. පේරාදෙණිය විශ්වවිද්‍යාලයෙන් උපාධි ලබා සිවිල් ඉංජිනේරුවෙකු ලෙස දිගු කලක් ශ්‍රී ලංකාවේ සේවයෙන් පසු, 1996 දී ඕස්ට්‍රේලියාවට සංක්‍රමණය කළ හේමාල්, නිව් සවුත් වේල්ස් ප්‍රාන්ත රජයේ සේවයේ යෙදෙන අතරතුර ලැබෙන හැම අවස්ථාවක දී ම, සිනුවර පැවැත්වෙන සංස්කෘතික ප්‍රසංගවල සිංහල මෙන් ම, හින්දි ගීත ද ගැයුවේ ය.
හේමාල් ජයවික්‍රම ගායකයාට තම සංගීත දිවිය අරුත්බර කරගන්නට අවකාශ ලැබුණේ ආචාර්ය ෂෙල්ටන් ප්‍රේමරත්නගේ සිනුවර ආගමනයට පසුවයි. වසර හතරක් ෂෙල්ටන් ප්‍රේමරත්න ගාන්ධර්වයා යටතේ සංගීතය ප්‍රගුණ කළ හේමාල් පසුව නටරාජ් නර්තන කලා සහ සංගීත ආයතනයට බැඳී සංගීතඥ අවිජිත් සර්කාර් යටතේ හින්දුස්ථානි රාගධාරී සංගීතය හදාරමින් ඉන්දීය ප්‍රසංගවල හින්දි ගීත ගායනය ද ඇරඹීය.

හේමාල් ජයවික්‍රම සංගීතවේදියා ස්වතන්ත්‍ර නිර්මාණකරණයේ යෙදෙන්නට පටන් ගත්තේ මීට දශකයටත් එපිට කාලයක ය. ඔහු සිනුවර නිපදවුණු සංගීත තැටි කිහිපයක් ම සඳහා, ගායනයෙන්, තනු නිර්මාණයෙන් සහ පද රචනයෙන් සම්මාදම් වී ඇත. එසේ දිගු කාලයක් තිස්සේ තමන් නිර්මාණය කළ ගීතාවලිය, සඳ ඔබෙයි මා නමින් සංයුක්ත තැටියක් ලෙසින් එළි දක්වන්නට හේමාල් ජයවික්‍රම සූදානම්ව සිටී.
"සඳ ඔබෙයි මා" සංයුක්ත තැටියේ අඩංගු ගී පහළොවෙන් දොළසක ම තනු නිර්මාණය හේමාල් ජයවික්‍රමගෙනි. එක් ගීතයක පදමාලාව ද රචනා කර ඇති හේමාල්, ගීත එකතුවේ අඩංගු ගී නවයක් ගායනා කරයි. "සඳ ඔබෙයි මා" ගීත එකතුව සඳහා නිර්මාණ දායකත්වය සපයා ඇති අනෙකුත් නිර්මාණකරුවන් නම්, සංගීත නිර්මාණයෙන් සහ ශබ්ද සංකලනයෙන් විශාරද ඉන්දු ප්‍රේමතිලක, ශ්‍රී ලංකාවේ වාද්‍ය වෘන්දය මෙහෙයවීමෙන් මහින්ද බණ්ඩාර, ගී පද රචනයෙන් පූජ්‍ය කුඩාගල කෝවිද, රසික සූරියආරච්චි, ඇනට් ගුණසේකර, ප්‍රසාදිනී වෙත්තසිංහ, නිහාල් රූපසිංහ, මෛත්‍රී පනාගොඩ සහ මලී දිසානායක, ගායනයෙන් දිනාලි සෝමවීර, රංගිකා මයුරපානී සහ ඉන්දු ප්‍රේමතිලක, යුග ගායනයෙන් ශශිකා නිසංසලා, ලංකා ප්‍රියංගනී, සමනලී ජයසූරිය, ඉරේෂා ගුණසේකර සහ රුවී නිම්නදී වේ.

"සඳ ඔබෙයි මා" ගී සමුච්චය මාර්තු මස තුන්වෙනිදා, ඉරිදා, සවස පෙනන්ට් හිල් ප්‍රජා ශාලාවේ දී එළි දැක්වෙනු ඇත. උත්සවය සංවිධානය කරනු ලබන්නේ නිව් සවුත් වේල්සයේ සංස්ථාපිත සිංහල සංස්කෘතික හමුවේ ලේඛක සංසදය විසිනි. මේ සංගීත සන්ධ්‍යාවට සහභාගී වෙන මෙන් සංගීතකාමී ඔබ සැමට සාදරයෙන් ඇරයුම් කරමු.







සන්නස SANNASA CARTOON By PK

